# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2271/39 – 2022 මාර්තු මස 18 වැනි සිකුරාදා – 2022.03.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වැලිගම් කෝරළයේ, සුළු කොට්ඨාසයේ, ජඹුරගොඩ නමැති ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් සකස් කරන ලද අංක MA/WEP/2019/792 හා 2020.02.04 වැනි දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර A වශයෙන් සඳහන් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0177 ක් පමණ වූ ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' - වැමුල්ල කුරුදුවත්ත- ප්‍රමාණය: හෙක්. 0.0177

උතුරට: ග්‍රාමෝදය මාවත සහ රෝහන කුමාර රත්නායක විසින් හිමිකම් කියන වැමුල්ල කුරුදුවත්ත; නැගෙනහිරට: රෝහන කුමාර රත්නායක විසින් හිමිකම් කියන වැමුල්ල කුරුදුවත්ත සහ ජඹුරෙගොඩ ගමාච්චිගේ විජයසේන විසින් හිමිකම් කියන වැමුල්ල කුරුදුවත්ත; දකුණට: ජඹුරෙගොඩ ගමාච්චිගේ විජයසේන විසින් හිමිකම් කියන වැමුල්ල කුරුදුවත්ත; බටහිරට: ජඹුරෙගොඩ ගමාච්චිගේ විජයසේන විසින් හිමිකම් කියන වැමුල්ල කුරුදුවත්ත සහ ග්‍රාමෝදය මාවත.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4-3/5/2019/HA/564.
2022 ජනවාරි මස 15 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.


1A – G 36390 – 20 (2022/03)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*